සියලුම හිමිකම් ඇවිරිණි.
All Rights Reserved


# අධ්‍යයන පොදු සහතික පත්‍ර (උ/පෙළ) විභාගය

**12 ශ්‍රේණිය** | **සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය** | **පිළිතුරු පත්‍රය**

## I කොටස

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| 01. (5) | 02. (2) | 03. (1) | 04. (4) | 05. (2) | 06. (5) | 07. (5) | 08. (2) | 09. (4) | 10. (2) |
| 11. (1) | 12. (1) | 13. (4) | 14. (3) | 15. (2) | 16. (1) | 17. (2) | 18. (2) | 19. (5) | 20. (3) |
| 21. (2) | 22. (1) | 23. (1) | 24. (5) | 25. (4) | 26. (3) | 27. (2) | 28. (5) | 29. (4) | 30. (5) |
| 31. (3) | 32. (1) | 33. (2) | 34. (4) | 35. (5) | 36. (2) | 37. (4) | 38. (2) | 39. (2) | 40. (1) |
| 41. (2) | 42. (5) | 43. (3) | 44. (1) | 45. (2) | 46. (5) | 47. (3) | 48. (3) | 49. (4) | 50. (2) |

(ලකුණු 100)

## II කොටස

.01. (1) ලිඛිත, වාචික, අවාචික, ශ්‍රව්‍ය,දෘශ්‍ය , විධිමත් අවිධිමත්

(2) වාචික සන්නිවේදනය වචන භාවිතය තුළින් සිදුවන තොරතුරු හුමවාරුවයි. භාෂාව භාවිතා කරගෙන සංකේත අර්ථ වචන මගින් අදහස් වෙනස් පුද්ගලයින්ට ප්‍රකාශ කරයි නම් එය වාචික සන්නිවේදනයයි.

අවාචික සන්නිවේදනය වචන භාවිතයෙන් තොරව සිදුවන සන්නිවේදනයයි. මෙය අචේතනිකව හෝ පුරුද්දට සිදුවන දෙයකි. පුද්ගලබද්ධ වන අතර අඛණ්ඩව මෙම සන්නිවේදන ස්වරූපය ක්‍රියාත්මක වේ. විවිධ ක්‍රම රැසක් උපයෝගී කරගනී. ඇස් සබඳතා , මුහුණේ ඉරියව් අංග චලන .....ආදිය

(3) පාලකයන් විසින් තොරතුරු පාලනය කරන බව හැඟවෙන සන්නිවේදන සංකල්පයයි. අදටත් මෙහි ලක්ෂණ මාධ්‍ය මගින් තොරතුරු ඉදිරිපත් කිරීමේදී ක්‍රියාත්මක වේ.

බලපත්‍ර ක්‍රමය දඩුවම් දීම රජය විසින් නීතිරීති පැනවීම වාරණය කිරීම ආචාර ධර්ම පද්ධතියක් සකසා තිබීම ආදිය මෙහි ලක්ෂණ ලෙසට නම් කළ හැකි ය. ඉහත කරුණුවලින් 4 ක් පහදා ඇත්නම් ලකුණු දෙන්න.

(4) සන්නිවේදනය පිළිබඳව එඩ්වඩ් සැපීර්ගේ නිර්වචනය මෙහිදී අදාළ වේ.

සමාජය සන්නිවේදනය හේතු කොට ගෙන සන්නිවේදනය තුළින් පවත්වාගෙන යන සබඳතා ජාලයකි. චර්යාවට අදාළ සෑම සංස්කෘතික රටාවක් ම හා සමාජ චර්යාවට අදාළ සෑම ක්‍රියාවක්ම කෙලින්ම වක්‍ර ආකාරයෙන් සන්නිවේදනයට සම්බන්ධකමක් ඇත.

සමාජය හා සන්නිවේදනය අතර ද්වියෝජනීය සබඳතාව නිර්වචනය ආශ්‍රයෙන් විස්තර වේ නම් ලකුණු දෙන්න.

02 (1) ගෝලියකරණය යනු දේශිය හා කලාපීය ප්‍රවිංචයන් ගෝලීය ප්‍රවිංචයන් බවට පත්වීමයි. පර්යාය වශයෙන් ලෝකගතකරණය, පෘථිවිකරණය, විශ්මිය කරණය ආදි විවිධ නම්වලින් හැඳින්වේ. නුතන සමාජයේ ක්ෂේත්‍ර ගණනාවකම සාකච්ඡාවට බඳුන්වන ප්‍රායෝගිකව ක්‍රියාත්මක කරන සංකල්පයකි.

(2) පිළිගත් පොදු න්‍යායක් නැත.

බහුමානීය හා බහුවිෂයික පරාසයක් පුරා පැතිර පවතින සංකල්පයකි.

අන්තර්විෂයිකව පාර විෂයිකව විශ්ලේෂණය කළ හැක

. ඓතිහාසික ස්වාභාවික ක්‍රියාවලියකි.


(3) ජාතික රාජ්‍ය සංකල්පය දුර්වල වීම / කලාපීයකරණය සිදුවීම /ද්‍රව්‍යමය ආර්ථිකය අභිබවා මුල්‍යමය ආර්ථිකය ශක්තිමත් වීම. / ගෝලිය තොරතුරු අවකාශයක් නිර්මාණය වීම / සන්නිවේදන හා ජනමාධ්‍යයන් ඒකීය පද්ධති බවට පත්වීම.

(4) නව මාධ්‍ය වර්ධනය වීම / නව සංස්කෘතික ස්වරූප ඇතිවීම / විචිත්‍ර සංස්කෘතියක් බිහිවීම / සංස්කෘතිය තුළ ජන සන්නිවේදන තොරතුරු මාධ්‍යයන්ගේ භූමිකාව වර්ධනය

ආදිය මෙන්ම ගෝලීයකරණය නිසා ඇති වූ ප්‍රවර්ධනයන් ද සමාජය කෙරෙහි විශාල බලපෑමක් සිදුකර ඇති ආකාරය විස්තර විය යුතු ය.

03 (1) ශැනොන් විවර්

(2)



(3) ශබ්ද මූලය සෝෂණය 1 අර්ථ බාධක 2 මාධ්‍ය බාධක

ඉහත ප්‍රභේද සරලව පහදා තිබිය යුතුයි.

අර්ථ බාධක යනු සංදේශයේ අර්ථය පිළිබඳව ඇති විය හැකි ගැටලු, මාධ්‍ය බාධකවලදී යොදාගන්නා තාක්ෂණික ක්‍රමවේද ආදියෙහි මතුවන ගැටලු නිසා ඇතිවන බාධාකාරී තත්වයන් අදහස් කෙරේ.

(4) ප්‍රතිපෝෂණය යනු සන්නිවේදකයාට පෙරලා ග්‍රාහකයාගෙන් ලැබෙන ප්‍රතිචාරයයි. සන්නිවේදන ක්‍රියාවලියක අඛණ්ඩ පැවැත්මට ප්‍රතිපෝෂණය අත්‍යවශ්‍යම මූලිකාංගය වේ. මෙය විස්තර විය යුතුයි.

04 (1) පුද්ගලයෙකු තමා අයත්වන සමාජය අපේක්ෂා කරන ආකාරයට තම සමාජ ජීවිතයේ හැසිරිය යුතු ආකාරය ඉගෙන ගැනීම සමාජානුයෝජනය නම් වේ.

(2) අනුකරණය / තදාත්මීකරණය / භූමිකා නිරූපණය

(3) යම් රටක, සමාජයක ජීවත්වන මිනිසුන් පරම්පරා ගණනක් තිස්සේ ගොඩනගා ගත් එම සමාජයටම ආවේණික වූ දැනුම අත්දැකීම් හා අවබෝධය මෙහිදී අන්තර්ගත වේ.

(4) පුරවැසියා මාධ්‍යකරණයට සහභාගිවන අතර එය සහභාගිත්ව සන්නිවේදනය නමින්ද හැඳින්වේ. අධිපතිවාදී දෘෂ්ටිකෝණය පසෙකලා පුරවැසි දෘෂ්ටියෙන් පුවත් වාර්තාකරණයේ යෙදෙන අතර පුරවැසි දෘෂ්ටිකෝණයෙන් පුරවැසි හඬ ඉස්මතු කිරීම සිදුවේ. තමන් අතැති විද්‍යුත් උපකරණ යොදා ගනිමින් සරලව තොරතුරු ඉදිරිපත් කෙරේ.

උදා : ගමක වූ ගරා වැටුනු පාසල පිළිබඳව ගම්වැසියෙක් තම දුරකථනයෙන් වීඩියෝගතකර මාධ්‍ය ආයතනයකට පුවතක් දීම.

05 (1) අණබෙර හූ හඬ ගිනි ගොඩක් ගැසීම දුම් මගින්, සතුන් මගින් පණිවුඩ යැවීම

(2) විද්‍යුත් මාධ්‍යය (රූපවාහිනිය ගුවන් විදුලිය) මුද්‍රිත මාධ්‍ය (පුවත්පත )

(3) දෙදෙනෙකුට වඩා වැඩි පිරිසක් අතර සිදුවන සන්නිවේදනය .

උදා: පන්ති කාමරය, මිතුරන්ගේ කතා බහ , කාර්යාලයක පිරිස, සම්මන්ත්‍රණයක්

හඳුනාගත හැකි කණ්ඩායමක් මෙහිදී සිටියි. නායකයින් හා නිලධාරීන් සහිතව උපකරණ ආදිය භාවිතයෙන් සන්නිවේදනය සිදුවීමට ඉඩ ඇත. ( මයික්‍රෆෝන් ශබ්ද විකාශන යන්ත්‍ර ) අන්තර් පුද්ගල සන්නිවේදනයේදී මෙන් ප්‍රතිපෝෂණය ප්‍රබල නොවේ.

(4) සංඥා , සංකේත , ඉඟි මගින් මුලින්ම සන්නිවේදනය සිදු කිරීම පසුව භාෂාවක් සොයා ගැනීම මෙන්ම විවිධ ප්‍රාථමික සන්නිවේදන ක්‍රම යොදාගෙන සන්නිවේදනයේ යෙදීම මෙන්ම පසුව අක්ෂර මාලාවක් සකසා ගෙන තාක්ෂණික ලෙස මුද්‍රණ යන්ත්‍රය ද පසුව රූපවාහිනිය ගුවන් විදුලිය දුරකථන ආදියද නූතනයේ නව මාධ්‍යයක් වන අන්තර්ජාලය දක්වාම මාධ්‍ය ව්‍යාප්ත වී දියුණු වීම සඳහන් විය යුතු ය.

06 (1) කවුරුන් කුමක් කුමන මාධ්‍යයකින් කවරෙකු හට කුමන බලපෑමක් උදෙසා කියයිද එය සන්නිවේදනයයි.

(2) සන්නිවේදක → සන්දේශය → මාධ්‍ය → ග්‍රාහකයා → බලපෑම

(3) මෙම ආකෘතිය ඒකමාර්ගිකය . සන්නිවේදනයේ අඛණ්ඩභාවය නොපෙන්වයි. සන්නිවේදක කේන්ද්‍රීය වන අතර භූමිකා හුවමාරුවක් නොපෙන්වන ආකෘතියකි.

ප්‍රතිපෝෂණය හා බාධා ගැන හඳුනා ගැනීමක් නැත

(4) මූලිකාංග පහකි.

(සන්නිවේදක සන්නිවේදනය කරන තැනැත්තා / සන්දේශය අදාළ පණිවිඩය / මාධ්‍ය පණිවිඩය සම්ප්‍රේෂණයට යොදාගන්නා මාධ්‍යය / ග්‍රාහකයා පණිවිඩ ලබන්නා / බලපෑම අදාළ පණිවිඩයෙන් සිදුවන බලපෑම.)

මේවා උදාහරණ ද සහිතව දක්වා ඇත්නම් සම්පූර්ණ ලකුණු දෙන්න.

07 (1) අන්තර්වර්ති පුද්ගල සන්නිවේදනය / පුද්ගලාන්තර සන්නිවේදනය / සමූහ සන්නිවේදනය / ජන සන්නිවේදනය

(2) මෙය ආත්ම භාෂණය ලෙස හඳුන්වයි. පංච ඉන්ද්‍රියන් මගින් ලබාගන්නා තොරතුරු පදනම් කර ගනිමින් තමා තුළම සිදුවන ක්‍රියාවලියකි. මෙහිදී සන්නිවේදකයා ග්‍රාහක භූමිකා දෙකම තමාමය.

පිටතින් නිරීක්ෂණය කළ නොහැකිය.

(3) තාක්ෂණික උපකරණ භාවිතයෙන් පුහුණු මාධ්‍යවේදීන් හරහා විශාල ග්‍රාහක පිරිසක් ඉලක්ක කර ගනිමින් සිදුකරන සන්නිවේදනයයි. මෙහිදී ප්‍රතිපෝෂණය සීමා සහිතය. / ග්‍රාහක බලපෑම වැඩිය.

(4)

| ජන සන්නිවේදනය | සමූහ සන්නිවේදනය |
|---|---|
| පුහුණු සන්නිවේදකයින් සිටී | පුහුණු සන්නිවේදකයින් අවශ්‍ය නැත |
| ග්‍රාහක පිරිස හඳුනාගත නොහැක | ග්‍රාහක පිරිස හඳුනාගත හැක |
| ප්‍රතිපෝෂණය සාපෙක්ෂව සක්‍රීය නොවේ | ප්‍රතිපෝෂණය සක්‍රිය වේ |
| තාක්ෂණය අනිවාර්ය වේ | තාක්ෂණය අනිවාර්ය නොවේ |

ඉහත ලක්ෂණ සැසඳිය යුතුය.